www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගල්ෆ් තෙල් ව්‍යසනය: ඩොලර් ට්‍රිලියන ගණනක සංගත අපරාධයක්

**Gulf oil disaster: a trillion-dollar corporate crime**

**2010 ජුනි 15**

මෙක්සිකෝ මුහුදේ තෙල් ව්‍යසනය වනාහි, අවබෝධ කරගැනීම මුලුමනින් ම පාහේ අසීරු සංගත අපරාධයකි. සංකීර්න මුහුදු හා පාරිසරික පද්ධතියට සිදුවන ඒකාබද්ධ හානිය, ධීවර හා සංචාරක කර්මාන්ත අතුගා දැමීම, සහ කලාපයේ ජනයා හට ඇති කරන දීර්ඝකාලීන සෞඛ්‍ය ගැටලු අතින් ගත්කල අවසාන පිරිවැය ඩොලර් ට්‍රිලියනය ඉක්මවා යා හැකිය.

ගැඹුරු මුහුදු පතුල විනාශ කොට කම්කරුවන් 11 දෙනකු ඝාතනය කරමින් නොනැවතී කාන්දුවන යෝධ තෙල් ප්‍රවාහය හා ජනනය කල පිපිරීම "හදිසි අනතුරක්" නොව හිතා මතා කල සංගත පිරිවැය කප්පාදුවේ හා නො තකා හැරීමේ ප්‍රතිඵලයකි. මන්ත්‍රී මන්ඩල බලශක්ති හා වානිජ කමිටුව මගින් සඳුදා නිකුත් කල ලියවිලිවලින් මෙම කරුනට වැඩිදුර සාක්ෂි එකතු කෙරිනි. එක් ලියවිල්ලක් වන්නේ තෙල් අටල්ල "එහි සිටින සැමකෙනෙකුට ම අනතුරු දායක ලිඳක්" යයි විස්තර කරමින් බීපී සමාගමේ ඉංජිනේරු බ්‍රයන් මොරෙල් පිපිරීමට සතියකට පෙර අප්‍රේල් 14 දා යැවූ ඊ-මේල් පනිවුඩයකි.

කමිටුව මගින් නිකුත් කල අමතර ලිපියක් ව්‍යසනයට දින ගනනකට පෙර බීපී නිලධාරීන් ගනු ලැබූ තීන්දු පිලිබඳව විස්තර කරයි. "මෙම තීන්දු පහේ පොදු ලක්ෂනය වන්නේ ඒවා පිරිවැය හා ලිඳේ ආරක්ෂාව යන දෙක අතරමැද තත්වයක පැවති බව ය" යයි ලිපිය කියා සිටියේ ය. "පෙනී යන පරිදි බීපී සමාගම සමාගමේ කාලය හා වියදම් අවම කරගැනීම සඳහා අවදානම් තීන්දු ගෙන තිබේ." මෙම සන්දර්භය තුල ධීවරයින්, මුහුදු ආහාර සැපයුම් කරුවන් හා සිය රැකියා අහිමි වූ අනෙකුත් අයට වන්දි ගෙවීමට ඩොලර් බිලියන 20ක අරමුදලක් ස්ථාපනය කරන ලෙස ඔබාමා පරිපාලනය හා ඩිමොක්‍රටික් කොංග්‍රස් සභිකයන් බීපී සමාගමෙන් ප්‍රසිද්ධියේ කරන ඉල්ලීම වංචාවකි.

බීපී සමාගම කොටස් හිමියන්ට කාර්තු දෙකක දී කරන ගෙවීම් පමනක් ඩොලර් බිලියන 20 ඉක්මවා යයි. සාකච්ඡාවට ලක්වන ප්‍රධාන මාතෘකා අතර ගල්ෆ් අර්බුදය ප්‍රමුඛස්ථානය දරද්දී, කොටස් හිමියන්ට කරන ගෙවීම් මාස කිහිපයකට සම්පූර්නයෙන් හෝ අර්ධ වසයෙන් නතර කිරීමේ මහජන ඉල්ලීමට සමාගම එකඟ වන "එකඟතාවක්" ලෙස මෙය වෙස්ගැන්වීමේ හැකියාව ඇත.

මෙය යෝධ තෙල් සමාගමට දෙනු ලබන ඵලදායී සමාවක් සහ පිටුපස දොරින් කරන ඇපතැබීමක් වනු ඇත්තේ, දේපොල අරමුදලට පිටතින් කරන ඕනෑම වන්දි ගෙවීමක වගකීම ප්‍රාදේශීය, ප්‍රාන්ත සහ මධ්‍යම ආන්ඩු මත පැටවෙමින් වෝල් වීදියේ ඇපතැබීම මෙන් ම මෙහි පිරිවැය ද කම්කරු පන්තියේ කරමතින් යැවීමෙනි.

ගල්ෆ් තෙල් ව්‍යසනයේ පරිමානය කොතරම්දැයි කිවහොත් පිරිසිදු කිරීම, වන්දි ගෙවීම සහ දීර්ඝකාලීනව හානිය පිලිසකර කිරීම සඳහා වන තථ්‍ය වියදම් පිලිබඳ ඕනෑ ම බරපතල තක්සේරුවක මිල ගනන්, ඩොලර් ට්‍රිලියන ගනනක් දක්වා හා තව තවත් ඉහල නගියි.

අර්ත් ඉකොනොමික්ස් නමැති පාරිසරික කන්ඩායම මගින් ප්‍රසිද්ධ කල තක්සේරුවකට අනුව, ලුවිසියානාහි මිසිසිපි ගංමෝයේ ආර්ථිකමය වටිනාකම පමනක් ඩොලර් බිලියන 330-ට්‍රිලියන 1.3 අතර වේ යයි ගනන් බලන ලද්දේ එමගින් සම්පාදනය කරනු ලැබෙන ජල සම්පාදනය, ජල ගැලීම් පාලනය, කුනාටුවලින් ආරක්ෂාව, ආහාර නිෂ්පාදනය, අමුද්‍රව්‍ය නිෂ්පාදනය, විනෝදාත්මක වටිනාකම, කාබන් රඳවාගැනීම, වායුගෝලීය සංයුති පාලනය, අපද්‍රව්‍ය ප්‍රතිකර්ම, සෞන්දර්යාත්මක වටිනාකම සහ වාසයට සුදුසු බව මත පදනම්ව ය. තව ද බීපී තෙල් දැන් ලුවිසියානා ප්‍රදේශයට අමතරව මිසිසිපි, ඇලබාමා සහ ෆ්ලොරිඩා තුඩුවේ වෙරලබඩ ප්‍රදේශ සෝදාගෙන යයි. සාගර පාරිසරික පද්ධතිවලට සහ ආහාර සම්පාදනයට තෙල් ධාරාවෙන් ඇති කරන බලපෑම මිනිය නො හැකි තරම් ඉහල නංවමින් මෙක්සිකෝ බොක්කේ මහාද්වීපික පරයට යට ප්‍රදේශයේ ගැඹුරු මුහුදේ යෝධ තෙල් දුමාරය අනාවරනය කරගනු ලැබ තිබේ.

අඩු පරාසයක ඇති මිසිසිපි ඩෙල්ටාව සඳහා වන අගැයීම පවා බීපී සමාගමේ වෙලඳපොල ප්‍රාග්ධනය වන ඩොලර් බිලියන 189 ඉක්මවා යයි. වෙනත් වචනවලින් කියතොත් කාන්දුව නැවැත්වීමට හෝ

හානිය ප්‍රතිසංස්කරනය කිරීමට විශාලතම තෙල් සමාගම්වලින් එකක සම්පත් නො සෑහේ.

ඉදිරියේ එන දින කිහිපය තුල ආධිපත්‍යය දරනු ඇත්තේ, ඔබාමා පරිපාලනය බීපී සමාගමේ විවේචකයෙක් සහ විරුද්ධවාදියෙක් ලෙස ද ජීවිකාවන් හා ජීවන රටාවන් අහිමි කෙරනු අයගේ නියෝජිතයෙක් ලෙස හුවාදැක්වීම ද ඉලක්ක කරගත් පියවර මාලාවකි. ඔබාමා මුහුදු කලාපයට කරන හතර වන සංචාරය, ඉන්පසුව අඟහරුවාදා රාත්‍රියේ ජාතිය අමතා කරන රූපවාහිනී කතාව, බදාදා ඉහල බීපී නිලධාරීන් සමග පවත්වන ධවල මන්දිර හමුව සහ බීපී ප්‍රධාන විධායක නිලධාරී ටෝනි හේවර්ඩ් කොංග්‍රස් කමිටුව හමුවේ පෙනීසිටීම මේවාට ඇතුලත් වේ. සාරය වසයෙන් ගත්කල මේවා ගල්ෆ් තෙල් ව්‍යසනයේ සැබෑ හේතු හෙලිදරවු නො කරන සහ ඒවා සඟවා තැබීම ඉලක්ක කරගත් මාධ්‍ය පුරාජේරු වනු ඇත.

මෙම ව්‍යසනයේ විශාලත්වය සහ එහි සියලු සංකීර්න ප්‍රතිඵල දුරවබෝධී වුවත් එම නවතම අර්බුදයේ මූලාශ්‍ර පැහැදිලි ය. බීපී සමාගමේ හැසිරීම සහ එහි පිලිවෙත් ධාවනය කරනු ලබන ගතිකයන් අනෙකුත් ප්‍රධාන සංගතයකින් වෙනස් නො වේ. ඊ ලඟ රුදුරු ව්‍යසනය එනතෙක් බීපී වනාහි, ලෝක ආර්ථිකය බිඳ දමා, මිලියන සිය ගනනක් කම්කරු ජනතාවන්ගේ රැකියා සහ ජීවන තත්වයන් විනාශ කොට, දැන් පෘථිවි ගෝලයට ම ස්ථිර හානියක් කිරීමට තර්ජනය කරන ජාත්‍යන්තර සංගත ප්‍රභුවේ වඩාත් ම කුප්‍රකට මුහුන පමනක් වනු ඇත.

ගැඹුරුවන ලෝක පරිමාන ආර්ථික අර්බුදයක් මධ්‍යයේ එන ගල්ෆ් තෙල් ව්‍යසනය, භූගෝලය පුරා වැඩ කරන ජනතාවන්ගේ දෑස් ඉදිරිපිට ලාභ ගරන පද්ධතිය තවදුරටත් අපකීර්තියට පත්කරයි. එය ප්‍රදර්ශනය කරන්නේ මානවයාගේ අතිමහත් බහුතරයේ ද ස්වභාව ධර්මයේ ම ද වියදමින් ධනපතියන්ට ලාභගැරීමේ නිදහස ලබදීම නියෝජනය කරන්නා වූ "නිදහස් වෙලඳපොලේ" සැබෑ ස්වභාවය යි.

සෑම අවංක හෙලිදරව්වක් ව්‍යංගයෙන් මතු කොට දක්වන්නේ, ලාභගරන පද්ධතියේ දූෂනයට සහ සාපරාධීත්වයට එරෙහි සමාජවාදී විකල්පය පිලිබඳ ගැටලුව යි. පසුගිය දශක තුන පුරා ආරක්ෂාව සහ පාරිසරික පාලනය ද ඇතුලත් වෙලඳපොල මත සීමාපැනවීම් සියල්ල ඉරාදැමීමට මූල්‍ය ප්‍රභුව විසින් පෙරට ගෙනඑන ලද ප්‍රතිප්‍රහාරයෙන් තෙල් කර්මාන්තය දැවැන්ත ලෙස වාසි ලබා ඇත. ඒඅයිජී, ගෝල්ඩ්මන් සැක්ස්, ලීමන් බ්‍රදර්ස්, එන්රොන්, එක්සොන් මොබිල්, යුනියන් කාබයිඩ් හා අනෙකුත් සංගත අපරාධකරුවන් දහස් ගනනකගේ අඩිපාරේ යන බීපී වනාහි මෙයින් ව්‍යතිරේකයක් නොව පවතින ධාරාව පිලිබඳ නවතම උදාහරනය යි.

මෙම නිර්ලජ්ජිත සංගත අපරාධයට පිලිතුර වන්නේ ගල්ෆ් වෙරලේ කම්කරුවන් නොව ධනපතියන් ලවා අර්බුදයට වන්දි ගෙවනු ලැබීම යි. මෙහි මුල් පියවරක් ලෙස ආර්ථික අවාසි වලින් පාඩු ලබන්නවුන්ට වන්දි ගෙවීමට හා තෙල් ධාරාව ගලායාම නැවැත්වීමට මෙන්ම හානිය ප්‍රතිපූර්නය කිරීමටත් බීපී සමාගමේ වත්කම් සාරාර්ථයෙන්ම අත්පත්කර ගත යුතුය.

මෙම ව්‍යසනයේ පිරිවැය පිරිමැසීමට අවශ්‍ය අමතර සම්පත් සම්පාදනය කරගැනීමට හා දැනටමත් මුහුදු කලාපයේ නිෂ්පාදනයේ යෙදී සිටින සිය ගනනක් වන අනෙකුත් තෙල් ලිංවල වැඩිදුර ව්‍යසන වැලැක්වීමට තෙල් කර්මාන්තය සමස්තයක් ලෙස ජනසතු කල යුතු ය. එනම් මහජන හිමිකාරීත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට නතු කල යුතුය.

ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් පක්ෂ එවැනි පිලිවෙතකට අශමනීය ලෙස විරුද්ධ වනු ඇතැයි පැවසීම අනවශ්‍ය ය. එම පක්ෂ දෙක ම ලාභ පද්ධතිය හා නිෂ්පාදන මාධ්‍ය අයිතිකරගැනීමට සහ පාලනය කිරීමට සුවිසල් සංගතවලට පවතින "හිමිකම" ආරක්ෂා කරති. "වෙලඳපොල" එනම් ධනපති පන්තිය පදනම්ව සිටින බලයට වැඩකරන ජනතාවන්ගේ අවශ්‍යතා යටත් කල යුතු ය යන්නට එම පක්ෂ දෙක ම එකඟ වෙති.

මහා සංගත හා බැංකුවල ග්‍රහනය බිඳිය හැකි එකම මාවත පෘථිවිගෝලය මත සිටින වඩාත් බලගතු සමාජ බලවේගය වන ඇමරිකානු හා ජාත්‍යන්තර කම්කරු පන්තියේ මහජන සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීම යි. එක්සත් ජනපදයේ හා ලෝකය පුරා සිටින වැඩකරන ජනයා සහ තරුනයෝ ලාභ පද්ධතිය මගින් නිෂ්පන්න කරන ව්‍යසනයන්ගෙන් අවශ්‍ය දේශපාලන පාඩම් උකහා ගත යුතු ය. මෙම ව්‍යසනය නිර්මානය කල කොන්දේසි අවසන් කල හැක්කේ සමාජවාදය සඳහා අරගලය මගින් පමනි. මෙම ක්‍රියාමාර්ගය සමග එකඟවන සියලු දෙනාගෙන් සමාජවාදී සමානතා පක්ෂයට බැඳී එය ගොඩනැගීමට එක්වන ලෙස අපි ඉල්ලා සිටිමු.

පැට්‍රික් මාටින්

© www.wsws.org